ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
University of Sri Jayewardenepura
බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය
External Degrees and Extension Courses Unit

# විශේෂ නිවේදනයයි

## 2014 අධ්‍යයන වර්ෂය සඳහා සමාජීය විද්‍යාවේදී පාරිසරික හා සංවර්ධන අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාවට ලියාපදිංචි වූ සිසුන්ගේ ලියාපදිංචි කාලය අවසන් කිරීම

විශ්වවිද්‍යාලයේ පවත්නා නීති රෙගුලාසි වලට අනුව 2014 අධ්‍යයන වර්ෂයට සමාජීය විද්‍යාවේදී පාරිසරික හා සංවර්ධන අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව සඳහා පළමු ලියාපදිංචිය වසර 03 ක කාලයක් දක්වා වලංගු වන අතර ඉතිරි වසර 04 ක කාලය සඳහා ලියාපදිංචිය දීර්ඝ කිරීම සිදු කල යුතු වේ. ඒ අනුව මුළු අධ්‍යයන වර්ෂ කාලය අධ්‍යයන වර්ෂ 07 කි. 2014 අධ්‍යයන වර්ෂයට ලියාපදිංචි වූ සිසුන්ගේ ප්‍රථම ලියාපදිංචි වලංගු කාල සීමාව 2014/09/01 දින සිට 2017/08/31 දිනෙන් අවසන් විය. ඉතිරි වසර 04 ක් සඳහා වන ලියාපදිංචිය දීර්ඝ කිරීමට අදාල වලංගු කාල සීමාව 2017/09/01 සිට 2021/08/31 දිනෙන් අවසන් වේ. පරීක්ෂණ සහ ලියාපදිංචි කිරීම් සම්බන්ධ නීති රීතිවලට අනුව මෙම වසර 7 ක කාලසීමාව තුල උපාධි I පරීක්ෂණ 07 ක්, උපාධි II පරීක්ෂණ 06 ක් සහ උපාධි III පරීක්ෂණ 05 ක් පැවැත්විය යුතු වේ.

**2014 අධ්‍යයන වර්ෂයට ලියාපදිංචි වූ සිසුන්ට පහත පරිදි පරීක්ෂණ පවත්වා ඇත**

| | ලියාපදිංචි කාලය | පවත්වා ඇති පරීක්ෂණ ගණන | | |
|---|---|---|---|---|
| | | **උපාධි I** | **උපාධි II** | **උපාධි III** |
| ප්‍රථම ලියාපදිංචිය (වසර 03) | 2014.09.01 - 2017.08.31 | 02 | 01 | 01 |
| ලියාපදිංචිය දීර්ඝ කිරීම (පළමුවර) | 2017.09.01 - 2018.08.31 | 01 | 01 | 01 |
| ලියාපදිංචිය දීර්ඝ කිරීම (දෙවනවර) | 2018.09.01 - 2019.08.31 | 01 | 01 | 01 |
| ලියාපදිංචිය දීර්ඝ කිරීම (තෙවනවර) | 2019.09.01 - 2020.08.31 | 01 | 02 | 01 |
| ලියාපදිංචිය දීර්ඝ කිරීම (සිව්වනවර) | 2020.09.01 – 2021.08.31 | 01 | - | - |
| | | **06** | **05** | **04** |

මේ වන විට 2014 අධ්‍යයන වර්ෂයට ලියාපදිංචි වූ සිසුන්ට ඉහත වගුවෙහි දක්වා ඇති පරිදි උපාධි I පරීක්ෂණ 06 ක්, උපාධි II පරීක්ෂණ 05 ක් සහ උපාධි III පරීක්ෂණ 04 ක් පවත්වා අවසන් ය. ඒ අනුව 2014 අධ්‍යයන වර්ෂයට ලියාපදිංචි වූ සිසුන්ට උපාධි I පරීක්ෂණ 01 ක්, උපාධි II පරීක්ෂණ 01 ක් සහ උපාධි III පරීක්ෂණ 01 ක් පවත්වනු ලැබේ. සිව්වනවර ලියාපදිංචිය දීර්ඝ කර ඇත්නම් උපාධි I, උපාධි II සහ උපාධි III පරීක්ෂණ 01 බැගින් පෙනී සිටිය හැකිය. සිව්වනවර ලියාපදිංචිය දීර්ඝ කරන ලද සිසුන් නැවත ලියාපදිංචි දීර්ඝ කිරීමේ ගාස්තු ගෙවීම අවශ්‍ය නොවේ.

ඒ අනුව 2014 අධ්‍යයන වර්ෂයට අදාල අවසාන ලියාපදිංචිය දීර්ඝ කිරීම යටතේ (එනම් 2020/09/01 සිට 2021/08/31 දක්වා කාලසීමාව) සමාජීය විද්‍යාවේදී පාරිසරික හා සංවර්ධන අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව උපාධි I, උපාධි II සහ III පරීක්ෂණ සඳහා ඉදිරියේදී අයදුම්පත් කැඳවීමට නියමිතව ඇති අතර එම අයදුම්පත් www.external.sjp.ac.lk යන අප වෙබ් අඩවියට පිවිස ලබා ගත හැක. ඉහත නීති රෙගුලාසි අනුව උපාධි I කොටස සඳහා පරීක්ෂණ 07 ක්, උපාධි II කොටස සඳහා පරීක්ෂණ 06 ක් සහ උපාධි III කොටස සඳහා පරීක්ෂණ 05 ක් පවත්වා අවසන් වූ පසු කිසිදු පරීක්ෂණයක් සඳහා පෙනී සිටීමට 2014 අධ්‍යයන වර්ෂයේ ලියාපදිංචි වූ කිසිඳු සිසුවෙකුට අවස්ථාවක් නොමැති අතර ඉන් පසු 2014 අධ්‍යයන වර්ෂයට අදාල **සමාජීය විද්‍යාවේදී පාරිසරික හා සංවර්ධන අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව** සම්පූර්ණ කිරීමට ලබාදුන් කාලය අවසන් වන බව කාරුණිකව දන්වා සිටිමි.

නියෝජ්‍ය ලේඛකාධිකාරී
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
2023/04/18

නියෝජ්‍ය ලේඛකාධිකාරී
බාහිර උපාධි හා විස්තාරික පාඨමාලා ඒකකය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය